(முழுப் பதிப்புரிமையுடையது)
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2013 (2014)

(01) පොදු ප්‍රශ්න පත්‍රය

පැය තුනයි

● ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.

1. පහත දැක්වෙන්නේ වින්ස්ටන් චර්චිල් නමැති හිටපු බ්‍රිතාන්‍ය අගමැතිවරයා විසින් කරන ලද සුප්‍රසිද්ධ ප්‍රකාශයකි.
"අනාගත අධිරාජ්‍යය වන්නේ, බුද්ධියේ අධිරාජ්‍යයයි."
අනාගත ලෝකය පදනම් කරගනිමින්, මෙම ප්‍රකාශයේ වලංගුතාව විවේචනාත්මකව අගය කරන්න.

2. "පොදු ජන යහපත නිශ්චය කර ගැනීම, ධනවාදී මෙන්ම කොමියුනිස්ට්වාදී හා සමාජවාදී යන ත්‍රිවිධ ක්‍රමයන්ට ම අසීරු වී තිබේ."
   (i) මෙම ප්‍රකාශය පිළිබඳ ව ඔබගේ අදහස් දක්වන්න.
   (ii) සමාජ වගකීම සම්බන්ධයෙන් සලකා බැලීමේ දී මෙම ප්‍රකාශය තුළින් ගම්‍ය වන කරුණු කවරේ ද?

3. "පොත් යනු ඉලෙක්ට්‍රොනික යුගයේ මියයමින් පවතින මාධ්‍යයකි, යන පුළුල් ව පැතුරුණු මතයට පටහැනි වුවත්, එය තාක්ෂණයේ සිදුවන වෙනස්කම් අනුව යමින් පුද්ගල අවශ්‍යතා අඛණ්ඩව සපුරාලන මාධ්‍යයක් ලෙස හඳුන්වා දිය හැකි ය."
මෙම ප්‍රකාශය පිළිබඳ ව ඔබගේ අදහස් දක්වන්න.

4. ශ්‍රී ලංකාවේ සමහර උසස් අධ්‍යාපන ආයතනවලට පිවිසෙන ආධුනිකයන් නවකවදය නාමයෙන් තර්ජනය කිරීම, හිරිහැර කිරීම, ආත්ම තෘප්තිය උදෙසා කෙරෙන හිංසා කිරීම් හා වෙනත් අමානුෂික ක්‍රියාවලට ලක් කිරීම වත්මන් ශිෂ්‍ය ප්‍රජාව තුළ සුලබව දැකිය හැකි සංසිද්ධියක් බවට පත්වෙමින් තිබේ.
   (i) වත්මන් ශිෂ්‍ය ප්‍රජාව මෙවැනි ක්‍රියාවන්ට යොමුවීම කෙරෙහි බලපාන්නට ඇතැයි ඔබ සිතන හේතු සාධක කවරේ ද?
   (ii) මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගවල සාර්ථක අසාර්ථකභාවය පිළිබඳව විමසීමක් කරන්න.

5. "සංස්කෘතික වශයෙන් ඇති වන අධ්‍යාත්මික දූෂණයේ ව්‍යසන හේතු කොටගෙන අපි අද පීඩා විඳිමින් සිටින්නෙමු. එසේ වුවත් ඕනෑම ගැටලුවකදී මනෝ විද්‍යාත්මකව ප්‍රතික්ෂේප කිරීමේ යාන්ත්‍රණයක් (a psychological rejection mechanism) මගින් එහි වැරදි හෝ නිවැරදි බව කිසිවෙකුටත් නිශ්චය කරගත නොහැකි වනු ඇත."
මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට හේතු දක්වන්න.

6. "සෑම අවශ්‍යතාවක් හෝ ඉල්ලුමක් රහිතව තම වාසිය තකා කටයුතු කෙරෙහි පෙළඹවීම ඇති දැන්වීම් කලාව (PersuasiveAdvertising) මගින් පුද්ගලයන් සතු සෑම තීරණ ගැනීමේ හැකියාව අහිමි වේ. එමගින් පුද්ගල ස්වාධීනත්වයට බරපතල හානියක් සිදු වේ."
   (i) මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට හේතු දක්වන්න.
   (ii) වර්තමාන ශ්‍රී ලාංකික දැන්වීම් කලාව සම්බන්ධයෙන් ඔබගේ දැක්ම කෙබඳු වේ ද?

7. "නිලධාරිවාදී පාලන තන්ත්‍ර (bureaucracy) සහිත බොහෝ රටවල ආර්ථික වශයෙන් පහළ මට්ටමේ සිටින පුද්ගලයන් විසින් ඔවුන්ගේ ජීවන රටාව පවත්වාගෙන යාම සඳහා කිසියම් කාර්යක් ඉටුකරදීමේ දී අල්ලසක් ලබාගනු ලැබේ. එහෙත් එය සදාචාරාත්මක ක්‍රියාදාමයට පටහැනි වූවකි."
මෙම ප්‍රකාශය පිළිබඳ ව ඔබගේ අදහස් දක්වන්න.

විවෘත තරඟ විභාගය - 2013 (2014)

## (02) ලෝක තතු I (දේශපාලන)

පැ තුනයි

● ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

1. පශ්චාත් සීතල යුද්ධ කාල පරිච්ඡේදයේ දී ලෝක දේශපාලනය තුළ පහත සඳහන් දෙකෙහි භූමිකාව විමර්ශ
කරන්න.
   (i) පෙර සුපිරි බලවතුන් දෙදෙනා
   (ii) කලාපීය බලවතුන්

2. ගෝලීය ත්‍රස්තවාදය පාලනය කර ගැනීමේ කාර්යයේ දී ජාත්‍යන්තර සහයෝගයේ වැදගත්කම පැහැදිලි කරන්

3. "පෘථිවියේ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම විශ්විය ව ා ි ෘකි." විමසන්න.

4. පහත සඳහන් රටවල වර්තමාන දේශපාලන අර්බුද පිළිබඳව විග්‍රහයක යෙදෙන්න.
   (i) යුක්රේනය
   (ii) තායිලන්තය

5. දකුණු ආසියානු කලාපීය සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීමේ දී ඉන්දියානු භූමිකාව පිළිබඳ විමසීමක යෙදෙන්න

6. මැද පෙරදිග තිරසාර සාමය ස්ථාපිත කිරීමට බාධා කරන සාධක මොනවා දැයි පරීක්‍ෂා කරන්න.

7. සීතල යුද්ධය නිමවීමෙන් පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානය ක්‍රියාවට නැගූ සාමසාධක භූමිකාව පිළිබ
විවේචනාත්මක රචනයක් ලියන්න.

8. උතුරු කොරියාව න්‍යෂ්ටිකහරණයට ලක්කිරීම සම්බන්ධයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ හා චීනයේ ප්‍රව
තුලනාත්මකව සසඳන්න.

9. පහත සඳහන් මාතෘක තුනක් පිළිබඳව කෙටි සටහන් ලි ා න්න.
   (i) යුරෝපීය ඒකාබද්ධතාව (European Integration)
   (ii) ඔබාමා පරිපාලනය යටතේ අග්නිදිග ආසියාව පිළිබඳව ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රතිපත්තිය
   (iii) 2014 ඉන්දියානු මහා මැතිවරණය
   (iv) මිහිතලය උණුසුම් වීම
   (v) අරාබි වසන්තය
   (vi) ඉරාකයේ වත්මන් දේශපාලන තත්ත්වය
   (vii) ජපන්-චීන සබඳතාවල වර්තමාන තත්ත්වය

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2013 (2014)

(03) ලෝක කටයුතු II (ආර්ථික)

පැය තුනයි

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

1. (i) පසුගිය වර්ෂ හතර කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ගෝලීය ආර්ථිකයේ මන්දගාමී වර්ධනය හා එයට බලපා ඇති හේතු සාකච්ඡා කරන්න.
   (ii) ගෝලීය මූල්‍ය හා ආර්ථික අර්බුද ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න.

2. (i) 2013 වර්ෂයේ ලොව වේගවත්ම වර්ධන වේගයක් අත්පත් කර ගත් ආර්ථිකයන් මොනවා ද?.
   (ii) වර්තමානයේ ලෝක ආර්ථික බලවතුන් අතර චීනය වැදගත්වීමට බලපා ඇති සාධක කවරේදැයි පැහැදිලි කරන්න.

3. (i) ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකයේ මෑත කාලීන උපනතීන් පරීක්ෂාකොට, එය දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කරන්න.
   (ii) මානව සංවර්ධන දර්ශකයේ ප්‍රබලතා සහ දුබලතා සාකච්ඡා කරන්න.

4. (i) N–11 (Next –11) රටවල් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
   (ii) පහත සඳහන් දර්ශක පැහැදිලි කරන්න.
   (අ) වෙළඳ තීව්‍රතා දර්ශකය (TII)
   (ආ) ව්‍යාපාර කරගෙන යෑමේ දර්ශකය (DBI)
   (ඉ) බහුමාන දරිද්‍රතා දර්ශකය (MPI)

5. (i) ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය විසින් සිරියාව සහ ඉරානයේ තෙල් අපනයනය මත පැන වූ සම්බාධක නිසා ගෝලීය තෙල් සැපයුමට එල්ල වූ බලපෑම අඩු කිරීමට හේතු වූ සාධක කවරේ ද?
   (ii) මෙම සම්බාධක හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය මත ඇතිවන බලපෑම් කවරේ ද?

6. (i) ලෝක වෙළඳාමේ මෑතකාලීන උපනතීන් පැහැදිලි කරන්න.
   (ii) ලෝක වෙළඳාමට ඇති බාධක ඉවත්කර හැරීමට යොදාගෙන ඇති ප්‍රවේශ මොනවාදැයි විස්තර කරන්න.

7. පහත සඳහන් ගෝලීය අර්බුද කෙටියෙන් පැහැදිලි කරන්න.
   (i) නැගෙනහිර ආසියාතික මූල්‍ය අර්බුදය
   (ii) ලතින් ඇමරිකානු ණය අර්බුදය
   (iii) ඇමරිකානු මූල්‍ය අර්බුදය
   (iv) යුරෝපීය ණය අර්බුදය

8. (i) සප්තා සහ සෆ්ටා (SAPTA & SAFTA) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
   (ii) බහු පාර්ශ්වීය වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා ටැරිෆ් හා වෙළඳාම පිළිබඳ පොදු සම්මුතිය (GATT) විසින් කරන ලද කාර්යභාරය පිළිබඳ ඇගයීමක් කරන්න.

[ 2 වැනි පිටුව බලන්න.

...புரிமையுடையது)
...Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)

## (04) රචනය

පැ. තුනයි

පහත සඳහන් මාතෘකා අතුරින් **එකක්** තෝරා ගෙන වාක්‍ය රචනා ලියන්න.

1. ලෝක සාමය ස්ථාපිත කිරීමෙහිලා නෙල්සන් මැන්ඩෙලා දැක්වූ දායකත්වය
2. රැකියාභිමුඛ අධ්‍යාපන ක්‍රියාවලියක වැදගත්කම
3. පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව (CHOGM) මගින් ශ්‍රී ලංකාවට අත්වන ප්‍රතිලාභ
4. ළමා පරපුරෙහි අභිවෘද්ධිය ඇති කිරීමෙහිලා ජනමාධ්‍යයේ කාර්යභාරය
5. "ස්වාභාවික ආපදා, රටක සංවර්ධන ක්‍රියාවලිය අඩාල කරන්නා සේ ම සංවර්ධන අවස්ථා ජනිත කිරීමට ද උපකාරී වේ."
6. ජාත්‍යන්තර සබඳතා වර්ධනය කිරීමෙහිලා ක්‍රීඩාවෙන් සැපයෙන පිටුබලය
7. දේශීය කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ දී ඒ හා බැඳුණු සාම්ප්‍රදායික දැනුම උපයෝගී කර ගැනීමේ වටිනාකම
8. ආසියානු කලාපීය රටවල සංවර්ධනය හා සාක් සමුළුව
9. විදේශගත වන ශ්‍රී ලාංකේය ගෘහ සේවිකාවන් සම්බන්ධව ජනිත වන සමාජ අර්බුද
10. සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ දී යොදාගත හැකි නව ක්‍රමෝපාය
11. සියුම් නිරීක්‍ෂණය හා කලාත්මක පරිකල්පනය පිළිබිඹු කෙරෙන ශ්‍රී ලාංකේය කලාශිල්ප
12. දේශපාලන අස්ථාවරත්වය මගින් රටක සංවර්ධනය කෙරෙහි ඇති කෙරෙන බලපෑම

***